# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: PFD/ITIT/INCM/pro
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2019.08.15

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක. 06/2019

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
පළාත් පාලන ආයතන ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන, රාජ්‍ය බැංකු, විශ්ව විද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන ප්‍රධානීන් සහ
රජයට අයත් සමාගම්වල සභාපතිවරුන්

<u>රාජ්‍ය ආයතන සඳහා සාමාන්‍ය රක්ෂණාවරණ ලබා ගැනීම</u>

රක්ෂණ වෙළෙඳපොළ සඳහා රට තුළ වඩාත් තරඟකාරී හා සාධාරණ පසුබිමක් ස්ථාපිත කරමින්, රාජ්‍ය ආයතන විසින් රජය සතු රක්ෂණ සමාගම් වෙතින් පමණක් රක්ෂණ සේවා ලබා ගත යුතු බවට සීමා කරමින් නිකුත් කරන ලද රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 04/2015 හි දැක්වෙන චක්‍රලේඛ උපදෙස් මෙමඟින් සංශෝධනය කරනු ලැබේ.

02. ඒ අනුව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) යටතේ ලියාපදිංචිව සිටින රක්ෂණ වෙළඳපොල තුළ ක්‍රියාත්මකව පවතින රක්ෂණ සේවා සම්පාදකයින් වෙතින් පමණක් තරඟකාරී මිල ගණන් කැඳවීම යටතේ රක්ෂණ නියෝජිතයන්ගේ/ තැරැව්කරුවන්ගේ සේවය ලබාගැනීමකින් තොරව සාමාන්‍ය රක්ෂණාවරණ සෘජුවම ලබා ගත හැකිය. රක්ෂණ සේවා ලබා ගැනීමේදී අනෙකුත් කරුණු අතර, අදාළ පිරිවැය, ආවරණය කරනු ලබන අවදානමේ ස්වභාවය සහ සේවාවේ ගුණාත්මකභාවය මෙන්ම ආයතනයට මෙම සේවාව ලබා ගැනීමේ පහසුව යන කරුණු ද ආයතන ප්‍රධානීන් විසින් සලකා බැලිය යුතුය. තවද, මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා රක්ෂණ සේවා සම්පාදකයින් හට ප්‍රමාණවත් කාල සීමාවක් ලබා දිය යුතුය.

03. තවද, කිසියම් රක්ෂණ සේවා සම්පාදකයෙකු සමඟ ගණුදෙනු කිරීමට පෙරාතුව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කොට අදාළ රක්ෂණ සමාගමේ විශ්වසනීයත්වය හා ශක්‍යතාව විමසා බැලීම යෝග්‍ය වේ. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන අත්හිටුවීමේ නිවේදන ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ වෙබ් අඩවියට අමතරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ ද පළ කරනු ලැබේ.

04. උක්ත විෂය සම්බන්ධයෙන් වන, අංක 04/2015 හා 2015/07/14 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය මෙමඟින් අවලංගු කරනු ලබන අතර මෙම චක්‍රලේඛයේ විධිවිධාන 2019/08/19 දින සිට බලාත්මක වනු ඇත.

05. www.treasury.gov.lk යන රාජ්‍ය මුදල්.දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය මඟින් මෙම චක්‍රලේඛය බාගත කළ හැකි වේ. මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු දුරකථන අංක 011-2484614 මඟින් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙතින් ලබා ගත හැක.

අත්කළේ / අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව

අත්කළේ / ආර්. එච්. එස්. සමරතුංග
භාණ්ඩාගාර ලේකම්

පිටපත් :
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4 විගණකාධිපති
5. අධ්‍යක්ෂ ජනරාල්, IRCSL: බලපත්‍ර අත්හිටුවීම් දැනුම් දීම සඳහා
6. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව